## මන්නාරම ප්‍රාදේශීය සභාව

## මන්නාරම දිස්ත්‍රික්කය

----------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 වන දිනද විගණනයට ඉදිරිපත්කර තිබුණි. වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුලි 18 දින සභාවේ ලේකම්ට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

(අ) රු. 804,647 ක් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව ගෙවියයුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු. 3,663,917 ක් ලෙස දක්වා තිබුණි. එ අනුව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස ගිණුම්වල රු. 2,859,270 ක් දක්වා නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වැඩ 13 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 15,594,800 ක මුදලක් වැය කර තිබුණද, එය ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා නොතිබීමෙන් වත්කම් රු. 15,594,800 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කාර්යාලයේ ප්‍රයෝජනයට ගනිමින් තිබු රු. 100,000 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍රයක් අළුත් ඡායා පිටපත් යන්ත්‍රයකට රු. 125,000 ක මුදල මාරුකර

ගෙන තිබුණි. එම මුදල ගිණුම්වලින් අඩු නොකිරීමෙන් ස්ථාවර වත්කම් රු. 100,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අදාල ලැබියයුතු ප්‍රදානය රු. 168,000 ක් ගිණුම්වල ලැබියයුතු මුදලක් වශයෙන් පෙන්වා නොතිබීමෙන් වත්කම් රු. 168,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) රු. 885,530 ක්වූ 2014 වර්ෂය පෙර සිට ලැබියයුතු හිඟ බැකෝ ලෝඩර් ආදායම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා නොතිබීමෙන් ජංගම වත්කම් රු. 885,530 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සහ අදාල වැට් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

-------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ වගන්තිය 126 | | සන්නිවේදන කුළුණුවලින් ආදායම් අය කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සභාව විසින් පනවා ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා <u>පරිපාලන) රීති</u> | | |
| | (i) | රීති අංක 5(xii) | මුදල් ගබඩා භාණ්ඩ භාරව ක්‍රියාකරන නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| | (ii) | රීති අංක 59 | එක් එක් වර්ෂ ආරම්භයේදී ආදායම් පරීක්ෂක, ආදායම් අධීක්ෂක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු සහා බලප්‍රදේශයේ සමීක්ෂණයක් පවත්වා 1987 |

| | | |
|---|---|---|
| | | අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වන වගන්තිය අනුව ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙලකර නොතිබුණි. |
| (iii) | රීති අංක 178(3) | භාණ්ඩ සැපයීම් ආයතනවල ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |

(ඇ) <u>මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| (i) මු.රෙ 371 2(ආ) සහ 5 | අවස්ථා 04 දී රු. 20,000 ඉක්මවා අත්තිකාරම් ලබාදී තිබුණු අතර කාර්යය නිමවූ විගස පියවීම කර නොතිබුණි. |
| (ii) මු.රෙ .571 | 1984 – 2013 වර්ෂය අතර කාල පරිච්ඡේදයට අදාල කල් ඉකුත්වූ තැන්පත් 6 ක එකතු වටිනාකම රු. 49,983 ක් විය. |

| | |
|---|---|
| (ඈ) මධ්‍යම රජයේ අධ්‍යක්ෂ ජනරාල් ගේ 2010 මාර්තු 10 දින PF/R/2/2/3/5/(4) අංක දරන ලිපියේ ඡේදය 1:4:1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම වාර්තා දිනය දක්වා පිළියෙල කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 9,194,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,340,703 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පහත සඳහන් ආදායම් විෂයයන්ගේ සමාලෝචිත වර්ෂය සඳහාවූ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් ප්‍රභවය | අයවැය ගත (රු.) | තත්‍ය (රු.) | හිඟ (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| කුලී | 4,301,652 | 8,850,411 | 4,548,759 | 106 |
| බලපත්‍ර ගාස්තු | 1,222,900 | 1,528,415 | 305,515 | 25 |
| සේවා සඳහා ගාස්තු | 1,239,900 | 820,793 | (419,107) | (34) |
| වරේන්තු ගාස්තු දඩ හා දඩ මුදල් | 6,933,000 | 1,767,220 | (5,165,780) | (75) |
| වෙනත් ආදායම් | 4,798,183 | 5,449,827 | 651,644 | (14) |
| එකතුව | 18,495,635 | 18,416,666 | (78,969) | |

### 2.2.2 කුලී

----

(අ) මස් කඩ හා මාළු කඩ 13 කින් අයවිය යුතු හිඟ කුලී රු.791,008 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ කඩ කාමර 18 කින් අයවියයුතු රු. 215,700 ක හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ සන්නිවේදන ආයතනවල කුළුණු 06 කින් අයවියයුතු රු. 45,000 ක අනුමත බදු මුදල අයකරගෙන නොතිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

**--------------**

2011 - 2015 වර්ෂවලට අදාලව රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 28,068,038 ක හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

**------------------**

2013 – 2014 කාලයට අදාල බැකෝ ලෝඩර් යන්ත්‍රයේ හිඟ බදු කුලි එකතුව රු. 634,830 ක් තිබුණි. වසර 4 ක් ගතවී ඇතත්, එය අයකර ගැනීමට සභාව විසින් නීතියානුකූලව කටයුතු කටයුතු කර නොතිබුණි.

**2.3 කොන්ත්‍රාත් පරිපාලන**

**------------------------**

(අ) ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද ප්‍රධාන කාර්යාලයේ ගරාජයේ 'H' වර්ෂයේ යකඩ කනු යෙදීමේදි පොලව යට 0.6 m ලෙස ලබා ගන්නා ලද මිනුම් අනුව 33.28 lm ක්ද, මිනුම්පත්‍ර අනුව 41.20 lm ලෙස තිබුණි. ඒ අනුව 7.92 lm ක් වැඩිපුර පෙන්වා රු. 27,720 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් අළුත්වැඩියා කරන ලද තලෙයිමන්නාරම පුස්තකාලයේ සවිකරන ලද ජනෙල්වල සැබෑ ප්‍රමාණය 12.56 $m^2$ වුවද, මිනුම්පත්‍රයේ 16.09 $m^2$ ලෙස දැක්වීමෙන් 3.53 $m^2$ ප්‍රමාණය සඳහා රු. 28,240 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

(අ) සභාවේ ගිණුම් අනුව ගෙවිය වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් 2004 වර්ෂය සිට රු. 804,647 ක් ලෙස දක්වා තිබුණද, අදාල දෙපාර්තමේන්තුවේ වාර්ෂික පොලි ගණනය කර 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,663,917 ක් ලෙස දක්වා තිබුණි. මෙම මුදල සනාථ කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ, රාජ්‍ය නොවන ආයතන, සමිති, පූජනීය ස්ථාන වලින් අයවියයුතු රු. 102,700 ක බැකෝ ලෝඩර් යන්ත්‍ර හිඟ කුලි අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.2 ප්‍රධාන කාර්යයලය හා එහි අවට පරිශ්‍රය

-----------------------------------------

(අ) ප්‍රධාන කාර්යයාලයේ පිවිසුම් දොරටුව පෙබරවාරි මාසයේ සිට තාප්පය සමග කඩාවැටි තිබුණු අතර විගණන දිනය දක්වා එය අළුත්වැඩියා කර කාර්යාල පිරිශ්‍රය ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය අපිරිසිදු තත්වයෙන් තිබුණු අතර ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සමග සම්බන්ධ කර ඉදිකරන ලද ගොඩනැගිලි සංකීර්ණය නිසිපරිදි සම්බන්ධ කර නොතිබීමෙන් වර්ෂා කාලවල වතුර කාන්දුවන තත්ත්වයක් නිරීක්ෂණය විය. පරිසරය නඩත්තු කිරීමෙහි නිසි කළමණාකරණයක් නොමැති බව පෙන්නුම් කරයි.

## 3.3 නිසි අනුමැතියක් නොමැති වියදම්

-----------------------------------

පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ 2016 ජුනි 03 දිනැති PL/3/1/47 අංක දරන ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම 2016 ව්‍යපෘතියේ 5 වන වැඩ සටහන් යටතේ "ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයට සහ සභා උප කාර්යාලවලට නාම පුවරු සවි කිරීම" හේතුවෙන් රු. 200,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 12 දරණ වවුචරය මගින් රු. 145,000 ක මුදලක් ගෙවා අනුමැතිය රහිතව ප්‍රධාන කාර්යාලය සඳහා නාමපුවරුවක් මිලදී ගෙන තිබීම අනුමැතියක් තොර වියදම් බව නිරීක්ෂණය විය.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදනය කරන ලද රු. 2,428,200 ක ඉතිරිවීම් පැවති අතර, එය සියයට 55 සිට සියයට 100 දක්වා පරාසයක් විය.

## 4.2 වත්කම් කළමනාකරණය

--------------------------

(අ) ප්‍රාදේශිය සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 5 කට අදාලව රු. 4,332 ක් වූ රක්ෂණ ගාස්තු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සෘජුවම ගෙවීම වෙනුවට නියෝජිතයෙකු මගින් ගෙවීම් කර තිබුණි.

(ආ) අංක 53 – 3325 වාහනය ක්‍රියාවිරහිතව තිබු අවස්ථාවේ 2015 ඔක්තොබර් 20 දින හා E/1 099140 අංක දරන ඇණවුම් මගින් ඩීසල් ලීටර් 50 ක් රු. 4,750 කට ලබා ගෙන තිබුණද, එම මුදල පියවා නොතිබුණි.

(ඇ) අළුත්වැඩියා කළයුතු තත්වයේ පවතින වාහන 03 ක ආදායම් බලපත්‍රයේ වලංගු කාලය 2013 වර්ෂයේ නිම වී තිබුනද, එම වාහන ක්‍රියාත්මක තත්වයේ නොතිබෙන බව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබියයුතු ගිණුම්

(ඈ) ස්ථාවර තැන්පත්

(ඉ) අත්තිකාරම් ලේඛන

(ඊ) ස්ථාවර වත්කම්